සබරගමුව පළාත් සභාව - சப்பிரகமுவ மாகாண சபை - Sabaragamuwa Provincial Council

# අධ්‍යාපන තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

கல்வி தகவல் தொழில் நுட்பம் மற்றும் கலாசார நடவடிக்கைகளுக்கான அமைச்சு

Ministry Of Education, Information Technology & Cultural Affairs

Email||:edusabaram@gmail.com Facebook||:SabEducationMinistry

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My Number | ME/E/03/18 - අ.ච. | ඔබේ අංකය<br>உமது இல<br>Your Number | | දිනය<br>திகதி<br>Date | 2018.05.25 |

පළාත් අධ්‍යාපන චක්‍රලේඛ
අංක - සබර/2018/02

සබරගමුව පළාතේ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ,
සියළුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියළුම කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
සියළුම සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපන විෂය භාර අධ්‍යක්ෂවරුන්,
සියළුම විදුහල්පතිවරුන්,

**<u>පාසල් දරුවන්ගේ සෞඛ්‍ය හා පෝෂණ තත්ත්වය.</u>**

මෙරට පාසල් දරුවන්ගේ 10% ක් පමණ සුවකල නොහැකි දියවැඩියා රෝගයෙන් හා 25% ක් පමණ දෑෂ්ටි අබාධවලින් පෙලෙන බවටත්, පාසල් දරු දැරියන් උදේ ආහාරය නිසි පරිදි ලබා නොගැනීම හේතුවෙන් මන්දපෝෂණයට ගොදුරු වී ඇති බවටත් හා දරු දැරියන් දන්ත ආබාධ වලට ලක්වීමේ ප්‍රවණතාවය වැඩිවී ඇති බවටත් විද්වතුන් විසින් සිදුකරන ලද පරීක්ෂණ අනුව අනාවරණය වී ඇත.

02. දරුවන් හා වැඩිහිටියන් ඇතුළු සමස්ථ සමාජයම කෘතිම විකෘති වූ ජීවන රටාවකට ගොදුරු වීම මෙයට ප්‍රධානම හේතුවකි. පාසල් දරුවන් යනු රටේ අනාගත ජීවනාලියයි. රට ගොඩනගන අනාගත පරපුරයි. රට ගොඩනගන්නට සිටින මෙම පරපුර පන්ති කාමරයේදීම රෝගීන් බවට පත්වන්නේ නම් එරට අනාගතය ඉතා අඳුරුය. එබැවින් වැඩිහිටියන් ලෙස අප, ගුරුවරුන්, දෙමව්පියන් මේ පිලිබඳව විශේෂ අවධානය යොමු කර අපගේ අනාගත පරපුර රටේ නිරෝගී, කාර්යක්ෂම හා ඵලදායී පුරවැසියන් බවට පත්කිරීමට අවශ්‍ය පියවර වහා ගත යුතුය.

03. මේ සම්බන්ධව පාසල් මට්ටමින් දෙමව්පියන් දැනුවත් කිරීමේ වැඩසටහන් මගින් දරුවන්ගේ සෞඛ්‍ය හා පෝෂණ තත්වය ඉහල නැංවීමට විධිමත් වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පියවර ගැනීමට කටයුතු කල යුතුය. එමෙන්ම සෑම පාසල් දරුවෙක්ම අනිවාර්යයෙන්ම අවම වශයෙන් ක්‍රීඩාවන් 02ක් තෝරාගත යුතු බව සඳහන් අධ්‍යාපන ලේකම්ගේ අංක ED/1/15/2/4/26 හා 2014.03.19 ලිපිය පිළිබඳව අවධානය යොමුකර පාසල් දරුවන් ක්‍රීඩාවට යොමුකර ඊට උනන්දු කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කල යුතුය. තවද, සෑම පාසලකම වාර්ෂික ක්‍රීඩා කරඟ පැවැත්වීම අනිවාර්යයෙන්ම සිදුකල යුතුය.

04. පාසල් දරුවන්ගේ සෞඛ්‍ය හා පෝෂණය පිලිබඳවත්, පාසල් වල භෝජනාගාරයන්හි ආහාර අලෙවිය පිලිබඳවත් වරින් වරරේඛීය අමාත්‍යාංශය හා පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය මගින් ලබාදී ඇති චක්‍රලේඛ උපදෙස් පරිදි නිසි වැඩපිලිවෙලක් පළාතේ පාසල් ආශ්‍රිතව ආරම්භ කර ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන ලෙස මෙයින් දන්වා සිටිමි.

ගරු අමාත්‍යතුමා Hon.Minister Office-045-5623222,045-2287306 Residence-045-2222538 Mobile-077-9102001 Fax-045-2228042
අමාත්‍යාංශ ලේකම් Secretary Office-045-2223015 Residence-045-2232985 Mobile-071-4402000 email-msweerasooriya@gmail.com
කාර්යාලය Office නවනගරය,රත්නපුර. Newtown,Rathnapura. Office-045-2222542 Fax-045-2228042

05. මෙහිදී ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ හා ප්‍රාදේශීය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී සමග සාකච්ඡා කර පාසල් මට්ටමින් සායන පැවැත්වීමට හා දැනුවත් කිරීමට අදාල වැඩසටහන් සකස්කර ක්‍රියාත්මක කිරීම ඉතා යෝග්‍ය වේ.

06. මේ සම්බන්ධව ඔබ විසින් ගන්නා ලද ක්‍රියාමාර්ග පිලිබඳ වාර්තාවක් ද මා වෙත ලැබීමට සලස්වන ලෙස වැඩිදුරටත් දන්වා සිටිමි.

මේ සම්බන්ධයෙන් ඔබ දෙපාර්තමේන්තුවේ/කලාප අධ්‍යාපන කාර්යලයේ/කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයේ සියළුම නිලධාරීන්/විදුහල්පතිවරුන් දැනුවත් කරන ලෙස තවදුරටත් දන්වා සිටිමි.

මහින්ද එස්. වීරසූරිය
ලේකම්
අධ්‍යාපන තොරතුරු තාක්‍ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
සබරගමුව පළාත් සභාව,
නව නගරය - රත්නපුර.

**මහින්ද එස්. වීරසූරිය,**
ලේකම්,
අධ්‍යාපන,තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය,
සබරගමුව පළාත.

Ministry of Provincial Education
Sabaragamuwa

පිටපත් :

1. පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ, සබරගමුව පළාත.
2. ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ, රත්නපුර/කෑගල්ල.
3. සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී.

(1-3) } අවශ්‍ය සහාය ලබාදීම සඳහා කාරුණිකව දන්වමි.

4. පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ සියළුම මාණ්ඩලික නිලධාරීන්.
5. පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ සියළුම මාණ්ඩලික නිලධාරීන්.
6. අධ්‍යක්ෂ, පූර්ව ළමාවිය අධ්‍යාපන සංවර්ධන අධිකාරිය.